සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

7 ශ්‍රේණිය | විද්‍යාව | කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

### I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ජීවයේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය කුමක්ද?

(1) පටකය (2) ජීවියා (3) සෛලය (4) පද්ධතිය

02. ජීවි දේහයේ සංවිධාන මට්ටම් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) සෛල පටක පද්ධති අවයව ජීවියා

(2) සෛල පටක අවයව පද්ධති ජීවියා

(3) සෛල අවයව පද්ධති පටක ජීවියා

(4) සෛල පද්ධති අවයව පටක ජීවියා

03. ශාකයක ආහාර පරිවහනය කරන්නේ කුමන පටකය මගින් ද?

(1) ප්ලෝයම (2) ශෛලම (3) කැම්බියම (4) මජ්ජාව

04. ආහාර ජීර්ණ පද්ධතියට අයත් නොවන අවයවය කුමක්ද?

(1) අග්න්‍යාශය (2) අන්නස්‍රෝතය (3) මහාන්ත්‍රය (4) ස්වරාලය

05. දිය බුලත් පැළෑටියක් හොඳින් සෝදා එහි මුල පද්ධතිය රතු පැහැයෙන් වර්ණ ගන්වන ලද ජල බඳුනක පැය කීපයක් තබා කඳ රතුපාට වූ පසු කඳේ හරස්කඩක් ගෙන අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ විට රතු පැහැයෙන් දිස්වන පටකය වන්නේ,

(1) ශෛලමය (2) ප්ලෝයමය (3) මැදිපිරවුම් පටකය (4) අපිචර්මය

06. වායුගෝලය දූෂණයට හේතුවන වායුමය දූෂකයක් වන්නේ,

(1) සිමෙන්ති කුඩු (2) කාබන් මොනොක්සයිඩ් (3) දූවිලි (4) ඊයම් අංශු

07. තල දර්පනයක් ඉදිරියේ තැබූ ඉංග්‍රීසි කැපිටල් අකුරු හතරක් පහත දැක්වේ. මේවායින් කුමන අක්ෂරය ඊට වෙනස් වූ ප්‍රතිබිම්බයක් දර්පනය තුළින් ප්‍රදර්ශනය කරන්නේද?

(1) A (2) T (3) O (4) P

08. තිරයකට ගතහැකි යටිකුරු ප්‍රතිබිම්බ ලබාගත හැක්කේ පහත සඳහන් කුමන ප්‍රකාශ උපකරණයෙන්ද?

(1) තල දර්පනය (2) උත්තල දර්පනය

(3) අවතල දර්පනය (4) වීදුරු තහඩුව

09. පුෂ්පයක දික්කඩ රූපයක් මෙහි දැක්වේ. එම රූපයේ X අක්ෂරයෙන් දක්වා ඇත්තේ,

(1) කලංකයයි. (2) කීලයයි.

(3) ඩිම්බකෝෂයයි. (4) ඩිම්බයයි.




10. පහත සංකේතයෙන් දැක්වෙන්නේ,



(1) වියළි කෝෂයකි.

(2) ඩයෝඩයකි.

(3) ධාරිත්‍රකයකි.

(4) ඇමීටරයකි.

11. ජලයේ වඩාත් හොඳින් දියවන ද්‍රව්‍යයකි.

(1) නිල් කුඩු (2) සීනි (3) කහ කුඩු (4) පොල්තෙල්

12. ඉහත රූප වලින් දක්වා ඇති බීජ හා ඵල ව්‍යාප්ත වන්නේ,



(1) ජලය මගිනි. (2) සුළඟ මගිනි.
(3) ස්පෝටනය මගිනි. (4) සතුන් මගිනි.

13. පටල කම්පනයෙන් **පමණක්** ශබ්දය නිපදවන උපකරණ ඇති පිළිතුර තෝරන්න.

(1) බෙරය, තබ්ලාව, බටනලාව. (2) හොරණෑව, බටනලාව, මැන්ඩලීනය
(3) රබාන, ගැටබෙරය, තම්මැට්ටම (4) වයලීනය, සිතාරය, ගිටාරය.

14. ද්විබීජ පත්‍රී ශාකයකි.

(1) මඩු (2) උණ (3) කිතුල් (4) පැපොල්

15. ප්‍රතිබිම්බ පහක් ලබා ගැනීමට තල දර්පන දෙකක් ආනතව තැබිය යුතු කෝණය කුමක්ද?

(1) 45 (2) 60 (3) 72 (4) 90

16. පෘථිවියේ ඇලුමිනියම් ලෝහය හා නිකල් ලෝහය ඇත්තේ පිළිවෙලින්,

(1) කබොලේ හා හරයේ ය. (2) කබොලේ හා ප්‍රාවරණයේ ය.
(3) ප්‍රාවරණයේ හා හරයේ ය. (4) හරයේ හා කබොලේ ය.

17. තැම්බූ බිත්තරයක් කටුව සහිතව හරස් අතට කැපූ විට පෘථිවි අභ්‍යන්තරයේ ව්‍යුහයට අනුරූප ආකෘතියක් ලෙස සැලකිය හැකිය. එහිදී බිත්තරයේ කහමදය අනුරූප වන්නේ පෘථිවියේ,

(1) කබොලට ය. (2) ප්‍රාවරණයට ය. (3) හරයට ය. (4) ඉහත කිසිවක් නොවේ.

18. වයින් කිරීම මගින් ක්‍රියාකරන සෙල්ලම් කාරයක ගබඩා වී ඇති ශක්ති ආකාරය කුමක්ද?

(1) රසායනික ශක්තියයි. (2) චාලක ශක්තියයි. (3) විභව ශක්තියයි. (4) විද්‍යුත් ශක්තියයි.

19. උත්තරාලෝකය හා දක්ෂිණාලෝකය නම් දර්ශන හට ගන්නේ කුමන ගෝලයේ ද?

(1) මධ්‍ය ගෝලය (2) ස්තර ගෝලය (3) තාප ගෝලය (4) බහිර් ගෝලය

20. ආලෝක අන්වීක්ෂයේ ප්‍රාචීරය මගින්,

(1) කදාව වේදිකාව මත රඳවා තබා ගැනීමට උපකාරී වේ.
(2) ප්‍රභවයෙන් ලැබෙන ආලෝකය වේදිකාව වෙතට යොමු කරයි.
(3) කදාව සහ අවනෙත අතර දුර වෙනස් කරයි.
(4) ආලෝක ප්‍රමාණය පාලනය කරයි.

21. මෙම රූපයෙන් පෙන්වා ඇත්තේ,



(1) ශාක පත්‍රයක යටි අපිචර්මීය පටකයයි. (2) හෘත් පේශී පටකයයි.
(3) රුධිර පටකයයි. (4) ලූණු සිවියේ සෛලයි.

22. රසායනික ශක්තිය තාප ශක්තිය

ඉහත ශක්ති පරිණාමනය හා හොඳින් ගැලපෙන්නේ,

(1) දහනය වන ඉටිපන්දමයි. (2) දල්වන ලද විදුලිපන්දමයි.
(3) රත්කළ විදුලි ඉස්ත්‍රික්කයයි. (4) බයිසිකල් ඩයිනමෝවයි.

23. පහත සඳහන් නගර අතුරෙන් උන්නතාංශය අඩු නගරය හා වායුගෝලීය පීඩනය අඩු නගරය පිළිවෙලින් දැක්වෙන වරණය කුමක්ද?

a - කොළඹ b - මහනුවර c - නුවරඑළිය.

(1) a හා b (2) a හා c (3) b හා c (4) c හා a

24. අපෘෂ්ඨවංශී සතුන් **පමණක්** දක්නට ලැබෙන පිළිතුර කුමක්ද?

(1) මුහුදු ලිහිණියා, සමනළයා, ගෙම්බා (2) ඉස්සා, ඉබ්බා, මුහුදු අශ්වයා
(3) මුහුදු ලිහිණියා, ගෙම්බා, කබරගොයා (4) කුඩැල්ලා, සමනළයා, ගොලුබෙල්ලා

25. අන්වීක්ෂය සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

a - අවනෙත වස්තුවට සමීප කාචයයි. b - දළ සීරුමාරුව මගින් දේහ නළය චලනය කළ හැකිය.
c - අවනෙත ලෙස අවතල කාච යොදා ගනී.

මේවායින් සත්‍ය වන්නේ,

(1) a හා b (2) a හා c (3) b හා c (4) a, b හා c සියල්ලම

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.

01. A සයුරි පවුලේ සියලු දෙනා සමඟ මාමාගේ නිවසට ගියේ මෝටර් රථයෙනි. මාමාගේ නිවස පිහිටියේ කඳුකර ප්‍රදේශයකය. එහිදී ඔවුහු සුන්දර දිය ඇල්ලක් අසල සෑහෙන වෙලාවක් නැවතී සිටි අතර සවස් වන විට මාමාගේ නිවසට ළඟා වූහ. මාමා රූපවාහිනිය නරඹමින් සිටින ආකාරය ඔවුහු දුටුවෝය. ආලින්දයේ විදුලි පහන් දල්වා තිබුණු අතර විදුලි පංකාව ද ක්‍රියාත්මක කර තිබුණි.

(1) ඡේදයේ යටින් ඉරි ඇඳ ඇති පහත සඳහන් පද වලින් ප්‍රදර්ශනය වන ශක්ති ආකාර මොනවාද?

(a) දිය ඇල්ල ................................

(b) රූපවාහිනිය ................................

(c) විදුලි පහන් ................................

(d) විදුලි පංකාව ................................ (ල. 4)

(2) මෝටර් රථය ගමන් කිරීම සඳහා ශක්තිය ලබා ගන්නේ ඉන්ධන (පෙට්‍රල්) දහනයෙනි. ඉන්ධන වල ශක්තිය ගබඩා වී ඇත්තේ කුමන ශක්ති ප්‍රභේදය / ආකාරය ලෙස ද? (ල. 1)

(3) දිය ඇල්ලක සිදුවන ශක්ති පරිණාමනය ලියන්න. (ල. 2)

B රූපයේ දැක්වෙන ලෙස සෙල්ලම් කරත්තයක් සකස් කිරීමට සූදානම් වූ ශිෂ්‍යයෙකුට ඒ සඳහා නූල් ඔතන බොබිනයක් සොයා ගැනීම අපහසු විය.



(1) ඒ වෙනුවට යොදාගත හැකි වෙනත් ද්‍රව්‍යයක් යෝජනා කරන්න. (ල. 1)

(2) මෙම උපකරණයේ ශක්තිය ගබඩා කර ඇති ද්‍රව්‍යය කුමක්ද? (ල. 1)

(3) එහි ශක්තිය ගබඩා කරන්නේ කෙසේද? (ල. 1)

(4) එම ශක්තිය ගබඩා කරන්නේ කුමන ශක්ති ආකාරය ලෙසද? (ල. 1)

(5) මෙම උපකරණය නිර්මාණය කිරීමේදී ඔබට ඇති වූ දුෂ්කරතාවයක් ලියන්න. (ල. 1)

02. A




පෘථිවියේ භූ තැටි දක්වන සිතියම මෙම රූපයෙන් දැක්වේ.

(1) භූ තැටි යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 1)

(2) ශ්‍රී ලංකාව අයත්වන භූ තැටිය නම් කරන්න. (ල. 1)

(3) භූ තැටි එකිනෙක සාපේක්ෂව චලනය වීමේදී භූ තැටි දෙකක් එකිනෙකින් ඈත් විය හැකිය. එසේ වුවහොත් ඇති වන ප්‍රතිඵලය කුමක් විය හැකිද? (ල. 1)

(4) භූ තැටි චලනය වීමේ දී භූ කම්පනයක් ඇති විය හැකිය. එසේ වීමට භූ තැටි කෙසේ චලනය විය යුතු ද? (ල. 1)

(5) භූ තැටි මායිමක් උතුරු ඇමරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ඇත. එය හඳුන්වන නම කුමක්ද? (ල. 1)

(6) භූ තැටි චලනය ආදර්ශනය කිරීම සඳහා ඔබට පන්ති කාමරය තුළ සිදු කළ හැකි ක්‍රියාකාරකමක් කෙටියෙන් දක්වන්න. (ල. 2)

B (1) පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය නිරූපණය සඳහා ත්‍රිමාණ ආකෘතියක් සෑදීමේ දී ඔබ යොදා ගත් ද්‍රව්‍ය මොනවාද? (ල. 1)

(2) එම ආකෘතිය සෑදූ ආකාරය පියවර 3 කින් දක්වන්න. (ල. 3)

(3) එම ආකෘතිය ඇසුරෙන් පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය ප්‍රදර්ශනය කළේ කෙසේද? (ල. 1)

03. A ඡායා ඇතිවීම සම්බන්ධව 7 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් සිදු කළ ක්‍රියාකාරකමකට අදාළ ද්‍රව්‍ය පිහිටන ආකාරය පිළිවෙලින් රූපයේ දැක් වේ.




(1) A ආලෝක ප්‍රභවයෙන් ආලෝකය නිකුත් කරන විට D මත පැහැදිලි තියුණු ඡායාවක් ලැබුණි නම් B හා C විය යුත්තේ කුමන ද්‍රව්‍යය ද? (ල. 2)

(2) D මත අපැහැදිලි බොඳ වූ ඡායාවක් ලබා ගැනීමට මෙහි යම් කොටසක් වෙනස් කළ යුතුය.

(a) එම වෙනස් කළ යුතු කොටස අදාළ අක්ෂරය ලියන්න. (ල. 1)

(b) ඒ වෙනුවට අලුතෙන් ඇතුළත් කළ යුතු කොටසේ තිබිය යුතු විශේෂ ලක්ෂණයක් / ගුණයක් ලියන්න. (ල. 1)

(3) B කොටස ඉවත් කර ශිෂ්‍යයාට D මත C හි ඡායාව හා උප ඡායාව දැක ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා C ද්‍රව්‍යය චලනය කළ යුත්තේ D දෙසට ද? A දෙසට ද? (ල. 1)

B (1) තල දර්පණ භාවිත වන අවස්ථා 02 ක් ලියන්න. (ල. 1)

(2) තල දර්පණ වලින් ඇතිවන ප්‍රතිබිම්බ වල ලක්‍ෂණ දෙකක් ලියන්න. (ල. 2)

(3) අවතල දර්පණයකින් උඩුකුරු ප්‍රතිබිම්බයක් ඇතිවන අවස්ථාවක දර්පණය වෙතට වස්තුව ගෙන ඒමේදී ප්‍රතිබිම්බයේ දැකිය හැකි වෙනස කුමක්ද? (ල. 1)

(4) වාහන වල පැති කණ්නාඩි ලෙස වක්‍ර දර්පණ වර්ගයක් භාවිත කරයි.

(a) එම දර්පණ වර්ගය නම් කරන්න. (ල. 1)

(b) එහි දී ඇති වන ප්‍රතිබිම්බයේ ලක්‍ෂණ දෙකක් ලියන්න. (ල. 2)

04. A ආහාර ජීර්ණ පද්ධතිය ආදර්ශනය කිරීම සඳහා ක්ලේ උපයෝගී කරගෙන සැකසූ ආහාර ජීර්ණ පද්ධතියේ රේඛීය රූප සටහනක් පහත දැක්වේ.




(1) රූප සටහනේ A, B, C, D, E, F කොටස් නම් කරන්න. (ල. 3)

(2) ජලය අවශෝෂණය සිදුවන්නේ කුමන ව්‍යුහය මගින්ද? (ල. 1)

(3) ආහාර ජීර්ණ පද්ධතියටත් ශ්වසන පද්ධතියටත් අයත් වන පොදු ව්‍යුහය කුමක්ද? (ල. 1)

(4) මුඛකුහරය තුළ දී ආහාර යාන්ත්‍රික ජීර්ණයට ලක්වේ. එය සිදුවන්නේ කෙසේද? (ල. 1)

B (1) මානව ශ්වසන පද්ධතිය හා එහි ක්‍රියාවලිය ආදර්ශනය කිරීම සඳහා විද්‍යාගාරයේ දී සකස් කළ ආකෘතියක රූප සටහනක් පහත දැක්වේ.

එහි A, B, C, D කොටස් මානව ශ්වසන පද්ධතියේ කවර ව්‍යුහවලට සමාන වේද? (ල. 4)




| ආකෘතියේ කොටස | ශ්වසන පද්ධතියේ ව්‍යුහය |
|---|---|
| A | ................................... |
| B | ................................... |
| C | ................................... |
| D | ................................... |

(2) මෙම ආකෘතියේ රබර් පටලය පහළට අදින විට දක්නට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න. (ල. 1)

(3) මෙය ශ්වසනයේ කුමන ක්‍රියාවලියට සමාන වේද? (ල. 1)

05. (1) පහත දැක්වෙන්නේ ධ්වනිය ජනනය වන ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා සිදු කළ ක්‍රියාකාරකමක රූප සටහනකි.




වියළි කෝෂයට සම්බන්ධ කම්බි සම්බන්ධ කළ විට,

(a) ලැබෙන නිරීක්ෂණය ලියන්න. (ල. 1)

(b) එයින් එළඹිය හැකි නිගමනය කුමක්ද? (ල. 1)

(2) අපේ කටහඬ ඇති වන්නේ කම්පනයක් හේතුකොට ගෙන වේ. එහිදී කම්පනය වන ව්‍යුහ මොනවාද? (ල. 1)

(3) පහත සඳහන් ධ්වනි ප්‍රභව වල ශබ්දය නිපදවීමට අවශ්‍ය කම්පනය වන දෑ සඳහන් කරන්න. (ල. 3)

| උපකරණය | කම්පනය වන දෑ |
|---|---|
| වයලීනය | ............................... |
| තබ්ලාව | ............................... |
| බටනලාව | ............................... |

(4) ධ්වනිය සම්බන්ධයෙන් විද්‍යාගාරය තුළ සිදුකළ ක්‍රියාකාරකමක රූප සටහනක් මෙහි දැක්වේ.




(a) පළමුව විදුලි සීනුව නාද කළ විට ලැබෙන නිරීක්ෂණය ලියන්න. (ල. 1)

(b) රික්ත පොම්පය ආධාරයෙන් ඝණ්ඨා සරාව තුළ ඇති වාතය සම්පූර්ණයෙන් ම ඉවත් වූ පසු දක්නට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න. (ල. 1)

(c) එයින් එළඹිය හැකි නිගමනය කුමක්ද? (ල. 1)

(5) ශිෂ්‍යයෙක් මේසයට කන තබා ඇඟිලි තුඩු වලින් මේසයට තට්ටු කර ශබ්දය හොඳින් ශ්‍රවණය වන බව පැවසීය. එයට හේතුව පහදන්න. (ල. 2)

(6) අකුණු ගැසීමකදී ආලෝකය හා ගිගිරුම් හඬ එකම මොහොතක ඇතිවන නමුත් ආලෝකය පළමුව ඇති වී සුළු මොහොතකට පසු ශබ්දය ඇසේ. එසේ වන්නේ ඇයි? (ල. 1)

06 (1) පහත දක්වා ඇති ආලෝක අන්වීක්ෂයේ A සිට E දක්වා ඇති කොටස් නම් කරන්න. (ල. 2)




(2) D මගින් සිදුකරන කාර්යය කුමක්ද? (ල. 1)

(3) ආලෝක අන්වීක්ෂය භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ල. 2)

(4) ආලෝක අන්වීක්ෂයක අවනෙත සහ නිදර්ශකය අතර ඇති දුර වෙනස් කළ හැකි ක්‍රම දෙකක් ලියන්න. (ල. 2)

(5) ආලෝක අන්වීක්ෂයක උපනෙත X 15 ලෙසද අවනෙත X 40 ලෙසද සඳහන් ව ඇත්නම් එහි විශාලනය කොපමණද? (ල. 1)

(6) ශාක නිදර්ශක තුනක් විනාකිරි ද්‍රාවණයක මධ්‍යසාර ද්‍රාවණයක සහ හුණු ද්‍රාවණයක ගිල්වා ඇත්නම් ඒවා අම්ල භෂ්ම උදාසීන ලෙස වර්ග කරන්න. (ල. 3)

(7) ඉහත ද්‍රාවණ වලට රතු ලිට්මස් කැබැල්ල බැගින් දැමූ විට වර්ණ වෙනසක් සිදුවේ නම් එය සිදු වන්නේ කුමන ද්‍රාවණයේද? (ල. 1)

07. පහත දැක්වෙන්නේ වායුගෝලයේ පවතින වායු ස්තර දැක්වෙන සටහනකි.




(1) X වායු ස්තරයෙන් ජීවීන්ට ඇති වැදගත්කම කුමක්ද? (ල. 1)

(2) X වායු ස්තරයේ ඇති වායු වර්ග අතුරෙන් වැඩිම ප්‍රතිශතයක් ඇති වායු තුන නම් කරන්න. (ල. 3)

(3) Y වායු ස්තරයෙන් ජීවීන්ට ලැබෙන වැදගත් ප්‍රයෝජනයක් ලියන්න. (ල. 2)

(4) උෂ්ණත්වය අඩුම වායු ස්තරය කුමක්ද? (ල. 1)

(5) අන්තර්ජාතික අභ්‍යවකාශ මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ කුමන වායු ස්තරයේද? (ල. 1)

(6) ජල වාෂ්ප අයිස් වළාකුළු ලෙස මිදී ඇති වායු ස්තරය කුමක්ද? (ල. 1)

(7) වායුගෝලයේ කෘත්‍යයන් දෙකක් ලියන්න. (ල. 2)

(8) වළාකුළුවල ඇති වන්නේ කුමන වර්ගයේ ආරෝපණද? (ල. 1)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 2 ) 03. ( 1 ) 04. ( 4 ) 05. ( 1 ) 06. ( 2 ) 07. ( 4 ) 08. ( 3 ) 09. ( 4 ) 10. ( 3 )
11. ( 2 ) 12. ( 2 ) 13. ( 3 ) 14. ( 4 ) 15. ( 2 ) 16. ( 1 ) 17. ( 3 ) 18. ( 3 ) 19. ( 3 ) 20. ( 4 )
21. ( 1 ) 22. ( 1 ) 23. ( 2 ) 24. ( 4 ) 25. ( 1 )

## II කොටස

01. A (1) (a) චාලක ශක්තිය
(b) ආලෝක ශක්තිය / ධ්වනි ශක්තිය
(c) ආලෝක ශක්තිය
(d) චාලක ශක්තිය (ල. 4)
(2) රසායනික ශක්තිය (ල. 1)
(3) විභව ශක්තිය චාලක ශක්තිය (ල. 2)
B (1) හිස් ටින් එකක් (ල. 1)
(2) රබර් පටිය (ල. 1)
(3) ඇඹරීමෙන් / දඟර ගැසීමෙන් (ල. 1)
(4) විභව ශක්තිය (ල. 1)
(5) රබර් පටිය නිවැරදි ආකාරයට ඇතුළු කළ නොහැකි වීම / හරියාකාරව දඟර ගැසීම කළ නොහැකි වීම වැනි හේතුවකට (ල. 1)
(මුළු ලකුණු 12)

02. A (1) පෘථිවි කබොල බෙදී ඇති කොටස් (ල. 1)
(2) ඔස්ට්‍රේලියන් ඉන්දියන් භූතැටිය (ල. 1)
(3) ගැඹුරු ආගාධයක් ඇති විය හැකිය. (ල. 1)
(4) එක් භූ තැටියක් අනෙක් තැටිය නෙරපා ඉහළට ගමන් කිරීම / භූ තැටි එකිනෙක මත ලිස්සා යාම. (ල. 1)
(5) සැන් ඇන්ඩ්‍රියාස් විභේදනය (ල. 1)
(6) දොඩම් ගෙඩියක පොත්ත කෑලි වලට වෙන් වන සේ පිහියකින් කපා අත්දෙකෙන් තෙරපීම. (ල. 2)
B (1) මැටි / ක්ලේ (ල. 1)
(2) එක් වර්ණයක ක්ලේ ගුලියක් සෑදීම / ඒ වටා වෙනත් වර්ණයක ක්ලේ තට්ටුවක් ඇලවීම / ඒ වටා තවත් වර්ණයක ක්ලේ තට්ටුවක් ඇලවීම. (ල. 3)
(3) එම බෝලය කපා බැලීමෙන් (ල. 1)
(මුළු ලකුණු 12)

03. A (1) B - පාරදෘශ්‍ය තහඩුව
C - පාරාන්ධ බෝලය (ල. 2)
(2) (a) B (ල. 1)
(b) පාරභාෂක ගුණය (ල. 1)
(3) A දෙසට / D ට විරුද්ධ දිශාවට (ල. 1)
B (1) මුහුණ බැලීමට / වාහන තුළ පිටුපස බැලීමට / බහුරූපේක්ෂ නිර්මාණය කිරීමට වැනි පිළිතුරු 2කට (ල. 1)
(2) උඩුකුරුයි / වස්තුවේ ප්‍රමාණයට සමානයි / තිරයකට ගත නොහැකිය වැනි පිළිතුරු 2 කට (ල. 2)
(3) ප්‍රතිබිම්බය විශාල වේ. (ල. 1)
(4) (a) උත්තල දර්පණ (ල. 1)
(b) කුඩයි / උඩුකුරුයි. (ල. 2)
(මුළු ලකුණු 12)

04. A (1) A - අන්තස්‍රෝතය B - අමාශය C - අග්න්‍යාශය
D - කුඩා අන්ත්‍රය E - අක්මාව F - මහාන්ත්‍රය (ල. 3)
(2) මහාන්ත්‍රය මගින් (ල. 1)
(3) ග්‍රසනිකාව (ල. 1)
(4) දත් මගින් ආහාර කුඩා කැබලි වලට කැඩීම. (ල. 1)
B (1) A - වම් ශ්වසනාලිකාව / ශ්වසනාලිකාව B - වම් පෙනහැල්ල / පෙනහැල්ල
C - මහා ප්‍රාචීරය D - උරස් කුහරය (ල. 4)
(2) රබර් බැලුනය පිම්බේ. (ල. 1)
(3) ආශ්වාස ක්‍රියාව (ල. 1)
(මුළු ලකුණු 12)

05. (1) (a) පොලිස්ටයරින් කැබලි ඉහළට විසි වේ. (ල. 1)
(b) නිගමනය - ශබ්දය නිපදවන විට ස්පීකරයේ කේතුව දෙදරීම (කම්පනය) වන බැවිනි. (ල. 1)
(2) ස්වර තන්ත්‍ර (ල. 1)
(3) වයලීනය - තන්තු /කම්බි තබ්ලාව - පටල
බටනලාව - වාතය (ල. 3)
(4) (a) විදුලි සීනුවේ හඬ හොඳින් ඇසිය හැක. (ල. 1)
(b) විදුලි සීනුවේ හඬ නොඇසේ. (ල. 1)
(c) ධ්වනිය ගමන් කිරීමට මාධ්‍යයක් අවශ්‍ය වේ. (ල. 1)
(5) ඝන මාධ්‍යය තුලින් වායු මාධ්‍යයකට වඩා හොඳින් ධ්වනිය සම්ප්‍රේෂණය වේ. /
ලී තුලින් වාතයට වඩා හොඳින් ශබ්දය ගමන් කරයි. (ල. 2)
(6) ශබ්දය ගමන් කරන වේගය ආලෝකයේ වේගයට වඩා අඩු වීමයි. (ල. 1)
(මුළු ලකුණු 12)

06 (1) A - උපනෙත B - දළ සීරුමාරුව C - අවනෙත
D - වේදිකාව E - දර්පනය (ල. 2)
(2) නිදර්ශකය තබා ගැනීම (ල. 1)
(3) නිවැරදි පිළිතුරකට (ල. 2)
(4) දළ සීරුමාරුව කරකැවීමෙන් හෝ සියුම් සීරු මාරුව කරකැවීමෙන්. (ල. 2)
(5) විශාලනය $= 15 \times 40 = 600$ (ල. 1)
(6) විනාකිරි - අම්ල මධ්‍යසාර - උදාසීන
හුණු ද්‍රාවණය - භෂ්ම (ල. 3)
(7) හුණු ද්‍රාවණයේ (ල. 1)
(මුළු ලකුණු 12)

07. (1) ජීවීන්ගේ ශ්වසනයට / ශාක වල ප්‍රභාසංස්ලේෂණයට වැනි පිළිතුරකට (ල. 1)
(2) නයිට්‍රජන්, ඔක්සිජන්, ආගන් (ල. 3)
(3) සූර්යාගේ සිට පැමිණෙන හානිකර කිරණ පෘථිවිය මතට පැමිණීම වැළැක්වීම. (ල. 2)
(4) මධ්‍යගෝලය (ල. 1)
(5) තාපගෝලය තුළ (ල. 1)
(6) මධ්‍යගෝලය (ල. 1)
(7) නිවැරදි පිළිතුරු දෙකකට (ල. 2)
(8) ස්ථිති විද්‍යුත් ආරෝපණ (ල. 1)
(මුළු ලකුණු 12)